# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1997 අංක 7 දරන
## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව පනත

---

[සහතිකය සටහන් කළේ 1997 ජුනි මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1997 ජුනි මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් **පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 18.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 4.60 යි.**

**1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව පනත**

[සහතිකය සටහන් කලේ 1997 ජුනි මස 18 වන දින]

එල්. ඩී.–ඕ. 22/95.

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව පිහිටුවීම සඳහා ද, එහි බලතල හා කර්තව්‍ය නියම්තව දැක්වීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1997 අංක 7 දරන, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව, පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

I වන කොටස

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව පිහිටුවීම**

2. (1) මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන, සංස්ථාවක් පිහිටුවනු ලැබිය යුතු ය. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව පිහිටුවීම.

(2) සංස්ථාව, (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාගත මණ්ඩලයක් විය යුතු අතර, සංස්ථාව විසින් ඒ නාමයෙන් නඩු පැවරීම ද සංස්ථාවට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටුවනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකනු ලබන යම් ශාඛා කාර්යාල ශ්‍රී ලංකාව තුළ කොළඹින් පිටත ස්ථානයන්හි පිහිටුවනු ලැබිය යුතු ය.

3. (1) සංස්ථාවේ පරිපාලනය සහ කළමනාකරණය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු ය:— අධ්‍යක්ෂ මණ්ඩලය.

(අ) නිල බලයෙන් පත්වන අධ්‍යක්ෂවරයන් දෙදෙනෙක්: එනම්—

(i) අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය යුතු නිවාස විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයෙක්: සහ

(ii) භාණ්ඩාගාරයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙක් :

(ආ) පහත සඳහන් පරිදි වූ අධ්‍යක්ෂවරයන් හතර දෙනෙක් : ඔවුන් අතුරින්—

(i) එක් අධ්‍යක්ෂවරයකු, මණ්ඩලය විමසා, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජිතයකු විය යුතු ය:

(ii) එක් අධ්‍යක්ෂවරයකු, නිවාස විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යවරයාගේ නියෝජිතයකු විය යුතු ය:

(iii) එක් අධ්‍යක්ෂවරයකු, මණ්ඩලය විමසා මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයකු විය යුතු ය:

(iv) එක් අධ්‍යක්ෂවරයකු, මණ්ඩලය විමසා කම්කරු විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන කම්කරු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයකු විය යුතු ය.

මේ ඡේදය යටතේ නම් කරනු ලබන අධ්‍යක්ෂවරයකු මෙහි මින් මතු "නම් කළ අධ්‍යක්ෂවරයකු" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(ඇ) 17 වන වගන්තියේ සඳහන් ආයතනවල දායක මුදල් ඒ වගන්තිය යටතේ ආපසු ගෙවනු ලැබූ පසු, නම් කළ අධ්‍යක්ෂවරයන් සංඛ්‍යාව ආණ්ඩුව හෝ ආණ්ඩුවේ ආයතන විසින් දරනු ලබන සංස්ථාවේ සම කොටස් ප්‍රාග්ධන ප්‍රමාණයට සමානුපාතික වන බව සහතික කිරීම පිණිස, නම් කළ අධ්‍යක්ෂවරයන්ගෙන් එක් අයකු හෝ ඊට වැඩි ගණනක්, අවස්ථාවෝචිත පරිදි, පළමුවන වාර්ෂික මහා සභා රැස්වීමේ දී හෝ ඊට පසු පැවැත්වෙන වාර්ෂික මහා සභා රැස්වීම්වල දී හෝ තම ධුරවලින් ඉල්ලා අස්විය යුතු ය.

(ඇ) සංස්ථාවේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී සංස්ථාවේ කොටස්හිමියන් විසින් තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයන් හතර දෙනෙක්:

එසේ වුවද, තෝරා පත් කර ගනු ලබන ඒ අධ්‍යක්ෂවරයන්ගෙන් වැඩි දෙනකු සෑම අවස්ථාවක දී ම ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය:

එසේම තවදුරටත්, මුලින්ම තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

මේ අතුරු විධානය යටතේ පත් කරනු ලබන අධ්‍යක්ෂවරයකු මෙහි මින් මතු "පත් කළ අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(2) (අ) නම් කළ අධ්‍යක්ෂවරයකු විසින්, තත් කාර්ය සඳහා අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(ආ) අමාත්‍යවරයා විසින්, ඕනෑම අවස්ථාවක ඒ සඳහා කිසිම හේතුවක් නොදක්වා නම් කළ අධ්‍යක්ෂවරයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(ඇ) (අ) සහ (ආ) ඡේදවල විධිවිධානවලට යටත්ව, නම් කළ අධ්‍යක්ෂවරයකුගේ ධුර කාලය, ඔහු නම් කිරීම කරනු ලැබූ ලිපියේ සඳහන් කාලය විය යුතු ය.

(ඈ) නම් කළ අධ්‍යක්ෂවරයකු මියගිය, ඉල්ලා අස් වූ හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ අවස්ථාවක, අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන, ඒ අධ්‍යක්ෂවරයා වෙනුවට වෙනත් තැනැත්තකු නම් කරනු ලැබිය හැකි ය. එසේ නම් කරනු ලබන තැනැත්තා, ඔහු අනුප්‍රාප්ත වන අධ්‍යක්ෂවරයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(ඉ) රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් හේතුවක් නිසා ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට නම් කළ අධ්‍යක්ෂවරයකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, ඒ අධ්‍යක්ෂවරයාගේ ධුරයේ කටයුතු කිරීම සඳහා තැනැත්තකු නම් කරනු ලැබිය හැකි ය.

(3) (අ) නියමිත දිනයට පසුව පවත්වනු ලබන සංස්ථාවේ පළමුවන වාර්ෂික මහා සභා රැස්වීමේ දී පත් කළ අධ්‍යක්ෂවරයන් දෙදෙනකු ධුර අත්හැරිය යුතු අතර, නියමිත දිනයට පසුව පැවැත්වෙන දෙවන වාර්ෂික මහා සභා රැස්වීමේ දී තවත් පත් කළ අධ්‍යක්ෂවරයන් දෙදෙනකු ධුර අත්හැරිය යුතු ය. මේ ආකාරයෙන් සියලුම පත් කළ අධ්‍යක්ෂවරයන් ධුර අත් හැරිය යුතු ය. යම් වාර්ෂික මහා සභා රැස්වීමක දී ධුරය අත්හැරිය යුතු පත් කළ අධ්‍යක්ෂවරයන් තීරණය කිරීම, ඒ වාර්ෂික මහා සභා රැස්වීමේ දී කුසපත් ඇදීමෙන් සිදු කරනු ලැබිය යුතු ය.

(ආ) පත් කළ අධ්‍යක්ෂවරයකු විසින් තත්කාර්ය සඳහා අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(ඇ) අමාත්‍යවරයා විසින්, ඕනෑම අවස්ථාවක ඒ සඳහා කිසිදු හේතුවක් නොදක්වා පත් කළ අධ්‍යක්ෂවරයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(ඈ) මේ උපවගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් අවස්ථානුගත කරුණු යටතේ හැර, පත් කළ අධ්‍යක්ෂවරයකු ධුරය අත්හරින අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ඒ අධ්‍යක්ෂවරයා වෙනුවට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(ඉ) රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් හේතුවක් නිසා පත් කළ අධ්‍යක්ෂවරයකුට ස්වකීය ධුරයේ කාර්ය ඉටුකිරීමට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, ඒ අධ්‍යක්ෂවරයාගේ ධුරයේ කාර්ය ඉටු කිරීම පිණිස වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(ඊ) ඉවත් කරනු ලැබීමෙන් හැර, අන්‍යාකාරයකින් ධුරය අත්හරින පත් කළ අධ්‍යක්ෂවරයකු, මේ වගන්තියේ මින් පසුව දක්වා ඇති විධිවිධාන යටතේ අධ්‍යක්ෂවරයකු ලෙස තෝරා පත් කර ගැනීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(4) (අ) සංස්ථාවේ වාර්ෂික මහා සභා රැස්වීමක දී, (3) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කළ අධ්‍යක්ෂවරයකු ධුරය අත්හරින අවස්ථාවක, ඒ වාර්ෂික මහා සභා රැස්වීමට පැමිණ සිටින කොටස් හිමියන් විසින් ඒ අධ්‍යක්ෂවරයා වෙනුවට වෙනත් තැනැත්තකු අනුප්‍රාප්තිකයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු ය. එසේ තෝරා පත් කර ගනු ලැබූ තැනැත්තකු මෙහි මින් මතු "තෝරා පත් කර ගත් අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(ආ) තෝරා පත් කර ගත් අධ්‍යක්ෂවරයකු විසින්, ඒ සඳහා මණ්ඩලය අමතා යවනු ලබන ලිපියක් මගින් ස්වකීය ධුරයන් ඉල්ලා අස්විය හැකි ය.

(ඇ) සංස්ථාවේ කොටස් හිමියන් විසින්, ඒ කොටස් හිමියන්ගේ රැස්වීමක දී සම්මත කර ගනු ලබන යෝජනා සම්මතයක් මගින්, තෝරා පත් කර ගත් අධ්‍යක්ෂවරයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(ඈ) (ආ) සහ (ඇ) ඡේදවල විධිවිධානවලට යටත්ව, තෝරා පත් කර ගත් අධ්‍යක්ෂවරයකුගේ ධුර කාලය අවුරුදු තුනක් විය යුතු ය.

(ඉ) කාලය ඉකුත් වීමෙන් ස්වකීය ධුරය අත්හරින තෝරා පත් කර ගත් අධ්‍යක්ෂවරයකු, නැවත තෝරා පත් කර ගැනීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(ඊ) තෝරා පත් කර ගත් අධ්‍යක්ෂවරයකු මිය ගිය, ඉල්ලා අස් වූ හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ අවස්ථාවක, සංස්ථාවේ කොටස් හිමියන් විසින් ඒ කොටස් හිමියන්ගේ රැස්වීමක දී ඒ අධ්‍යක්ෂවරයා වෙනුවට අනුප්‍රාප්තිකයකු වශයෙන් වෙනත් තැනැත්තකු තෝරා පත් කර ගනු ලැබිය යුතු ය. එසේ තෝරා පත් කර ගනු ලැබූ තැනැත්තා, තමා අනුප්‍රාප්ත වන අධ්‍යක්ෂවරයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(උ) රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් හේතුවක් නිසා තෝරා පත් කර ගනු ලැබූ අධ්‍යක්ෂවරයකුට ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, සංස්ථාවේ කොටස් හිමියන් විසින් ඒ කොටස් හිමියන්ගේ රැස්වීමක දී, ඒ අධ්‍යක්ෂවරයා වෙනුවෙන් කටයුතු කිරීම පිණිස වෙනත් තැනැත්තකු තෝරා පත් කර ගනු ලැබිය හැකි ය.

4. (1) සංස්ථාවේ ප්‍රාග්ධනයෙන් රුපියල් පත් දහසකට අඩු නොවන වටිනාකමක් ඇති කොටස් මුදල්— අධ්‍යක්ෂවරයකු වීම සඳහා සුදුසුකම්.

(අ) යම් තැනැත්තකුට ඇත්නම්ඃ හෝ

(ආ) ඇති සංස්ථාගත මණ්ඩලයක යම් තැනැත්තකු අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු වන්නේ නම්

මිස, ඒ තැනැත්තා 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂවරයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට සුදුස්සකු නොවිය යුතු ය:

එසේ වුවද මහජනතාව වෙත ප්‍රථම කොටස් නිකුත් කිරීමෙන් පසුව මාස දෙකක් ඉකුත් වන තෙක්, 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ තෝරා පත් කර ගනු ලබන මුල් අධ්‍යක්ෂවරයන්ට මේ උප වගන්තියේ සඳහන් සුදුසුකම් තිබීම අවශ්‍ය නොවන්නේ ය.

(2) යම් තැනැත්තකු—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ එවැනි මන්ත්‍රීවරයකු හෝ සභිකයකු බවට පත් වන්නේ නම්;

(ආ) සංස්ථාවේ නිලධරයකු හෝ සේවකයකු වේ නම් හෝ එවැනි නිලධරයකු හෝ සේවකයකු බවට පත් වන්නේ නම්;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ බුන්වත් හෝ බංකොලොත් බවට ප්‍රකාශයට පත් කරනු ලැබූ තැනැත්තකුව සිටිය දී එසේ බුන්වත් භාවයෙන් හෝ බංකොලොත් භාවයෙන් මුදා හරිනු නොලැබ ඇත්නම්;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහි විකල් තැනැත්තකු බවට තීරණය කරනු ලැබ සිටී නම් හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ සිටී නම්;

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් නියම කරන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳ ඇත්නම් හෝ විඳිමින් සිටී නම්

ඒ තැනැත්තා, අධ්‍යක්ෂවරයකු වශයෙන් නම් කරනු ලැබීමට, පත් කරනු ලැබීමට හෝ තෝරා පත් කර ගනු ලැබීමට නැතහොත් අධ්‍යක්ෂවරයකු වශයෙන් ධුරයෙහි දිගට ම කටයුතු කර ගෙන යාමට සුදුස්සකු නොවන්නේ ය.

5. (1) අධ්‍යක්ෂවරයන් විසින්, ඔවුන් අතුරින් මණ්ඩලයේ සභාපතිවරයකු තෝරා පත් කර ගනු ලැබිය යුතු ය. මණ්ඩලයේ සභාපතිවරයා.

(2) සභාපතිවරයා විසින් තත් කාර්ය සඳහා මණ්ඩලය වෙත යවනු ලබන ලිපියක් මගින්, සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(3) මණ්ඩලය විසින් යෝජනා සම්මතයක් මගින්, සභාපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) (2) වන හා (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය ඔහු මණ්ඩලයේ සාමාජිකත්වය දරන කාලය විය යුතු ය.

(5) රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් හේතුවක් නිසා සභාපතිවරයාට තාවකාලිකව ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, සභාපතිවරයා වෙනුවෙන් කටයුතු කිරීම පිණිස, අධ්‍යක්ෂවරයන් විසින් ඔවුන් අතුරින් තැනැත්තකු තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

6. (1) සභාපතිවරයා මණ්ඩලයේ සියලු රැස්වීම්වල මූලාසනය දැරිය යුතු අතර, මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නැති අවස්ථාවක දී, ඒ රැස්වීමට පැමිණ සිටින අධ්‍යක්ෂවරයන් විසින් ඔවුන් අතුරින් තැනැත්තකු ඒ රැස්වීමේ සභාපතිවරයා ලෙස තෝරා ගනු ලැබිය යුතු ය. මණ්ඩලයේ රැස්වීම.

(2) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය අධ්‍යක්ෂවරයන් පස් දෙනකු විය යුතු ය.

(3) මණ්ඩලයේ යම් රැස්වීමක සභාපතිවරයාට, ස්වකීය ඡන්දයට අතිරේකව තීරණ ඡන්දයක් තිබිය යුතු ය.

(4) මණ්ඩලයේ රැස්වීමක් කැඳවීම පිළිබඳව දැන්වීමක් ලැබීමට තත් කාලයෙහි හිමිකම් ඇති අධ්‍යක්ෂවරයන් සියලු දෙනා විසින් ම අත්සන් තබනු ලැබූ ලියවිල්ලකින් වූ යෝජනා සම්මතයක්, ඒ යෝජනා සම්මතය යථා පරිදි කැඳවනු ලැබ පවත්වනු ලැබූ මණ්ඩලයේ රැස්වීමක දී සම්මත කරගනු ලැබූ යෝජනා සම්මතයක් වූවාක් මෙන් වලංගු සහ බලසහිත විය යුතු ය.

(5) මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් එහි රැස්වීම් සම්බන්ධයෙන් ද, ඒ රැස්වීම්වල කටයුතු කිරීම සම්බන්ධයෙන් ද, කාර්ය පටිපාටිය විධිමත් කර ගනු ලැබිය හැකි ය.

(6) අධ්‍යක්ෂවරයන් සියලුදෙනාට ම හෝ ඉන් යම් අධ්‍යක්ෂවරයකුට සංස්ථාවේ කොටස් හිමියන්ගේ රැස්වීමක දී ඒ කොටස් හිමියන් විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.

ගිවිසුමක් පිළිබඳව ඇති තම සම්බන්ධතාව අධ්‍යක්ෂවරයකු විසින් අනාවරණය කළ යුතු බව.

7. මණ්ඩලය විසින් එළඹීමට යෝජිත යම් ගිවිසුමක් පිළිබඳව කෙළින් ම හෝ අන්‍යාකාරයකින් සම්බන්ධතාවක් ඇති අධ්‍යක්ෂවරයකු විසින්, තම සම්බන්ධතාවේ ස්වභාවය මණ්ඩලයේ රැස්වීමක දී අනාවරණය කළ යුතු ය. ඒ අනාවරණය කිරීම මණ්ඩලයේ වාර්තාවල වාර්තාගත කළ යුතු අතර, ඒ ගිවිසුම සම්බන්ධයෙන් මණ්ඩලය විසින් කරනු ලබන යම් සාකච්ඡාවකට හෝ ගනු ලබන යම් තීරණයකට ඒ අධ්‍යක්ෂවරයා සහභාගි නොවිය යුතු ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ බලතල.

8. මේ පනත හෝ වෙනත් යම් නීතියක් යටතේ සංස්ථාව සතු වන බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම හා කිරීම ද සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම සහ පාලනය කිරීම සඳහා අවශ්‍ය වන සියලු ක්‍රියා සහ දේවල් ද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කරනු ලැබිය හැකි ය.

බලය පැවරීම.

9. මණ්ඩලය විසින් එහි බලතල, කාර්ය හා කර්තව්‍ය කිසිවක් අධ්‍යක්ෂවරයන් තුන් දෙනකුට අඩු නොවූ අධ්‍යක්ෂවරයන් සංඛ්‍යාවකින් සමන්විත මණ්ඩලයේ යම් කමිටුවකට පවරනු ලැබිය හැකි ය. එවැනි යම් බලතල පැවරීමක් නොතකා, මණ්ඩලය විසින් එවැනි යම් බලයක් ක්‍රියාත්මක කිරීම, කාර්යයක් කිරීම හා කර්තව්‍යයක් ඉටු කිරීම කළ හැකි ය.

සංස්ථාවේ මුද්‍රාව.

10. (1) සංස්ථාවේ මුද්‍රාව මණ්ඩලය භාරයේ තිබිය යුතු ය.

(2) සංස්ථාවේ මුද්‍රාව මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) අධ්‍යක්ෂවරයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තබනු නොලැබිය යුතු අතර, ඒ අධ්‍යක්ෂවරයන් දෙදෙනා ම තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයකට අත්සන් තැබිය යුතු ය.

11. මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීම නැතහොත් මණ්ඩලයේ යම් සාමාජිකයකු නම් කිරීමෙහි, පත් කිරීමෙහි හෝ තෝරා පත් කර ගනු ලැබීමෙහි ලා යම් දෝෂයක් තිබීම නිසාම පමණක් මණ්ඩලයේ හෝ එහි යම් කමිටුවක යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් බලරහිත නොවිය යුතු ය: නැතහොත් බලරහිත වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය. පුරප්පාඩුවක් තිබුණ ද මණ්ඩලයට ක්‍රියා කළ හැකි බව.

## II වන කොටස

### සංස්ථාවේ කර්තව්‍ය හා බලතල

12. සංස්ථාවේ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු ය:— සංස්ථාවේ කර්තව්‍ය.

(අ) මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ගුරුඋපදේශවලට අනුකූලව නිවාස තැනීමේ කාර්ය සඳහා සහ නේවාසික දේපළ නිදහස් කර ගැනීම සඳහා පුද්ගලයන්ට සහ නිවාස මූල්‍ය සංස්ථාවලට ණය ප්‍රදානය කිරීම සහ වෙනත් ආකාරයෙන් වූ මූල්‍යමය ආධාර ප්‍රදානය කිරීම:

(ආ) නිවාස සංවර්ධනය ස්වකීය අරමුණ වන සමාගම්වලට දායකවීම සහ වෙනත් සෑම විස්තරයක වූ කොටස් සහ සුරැකුම්පත් මිළ දී ගැනීම:

(ඇ) නිවාස තැනීමට අදළ අධෝව්‍යුහය සංවර්ධනය කිරීමෙහි ලා සහභාගී වීම සහ ප්‍රවර්ධනය කිරීම :

(ඈ) නිවාස යෝජනා ක්‍රමවල ජීවත්වන තැනැත්තන්ට පහසුකම් සැලසීම:

(ඉ) නිවාස තැනීමේ යෙදී සිටින පුද්ගලයන්ට හා ආයතන වලට, නීති සේවා, ඉංජිනේරු සේවා, ගෘහ නිර්මාණ ශිල්පී සේවා ද මිනින්දෝරු සේවා සහ වෙනත් ආධාරක සේවා ද සැපයීම:

(ඊ) නිවාස තැනීමේ තාක්ෂණය, ගොඩනැගිලි උපකරණ සහ නිවාස හා මනුෂ්‍යයාගේ පදිංචියට අදළ වෙනත් කාරණා පිළිබඳව පර්යේෂණ කිරීම, සමීක්ෂණ පැවැත්වීම හා අධ්‍යයන කිරීම භාර ගැනීම:

(උ) නිවාස තැනීමේ කාර්ය සඳහා ණය ලබා දීම පිණිස සම්පත් ඒකරාශී කිරීමට යෝජනා ක්‍රම සකස් කිරීම:

(ඌ) සමාජයේ ආර්ථික වශයෙන් අවාසිදායක තත්ත්වයක පසුවන කොටස්වලට නිවාස සැපයීම සඳහා යෝජනා ක්‍රම සකස් කොට ඒවා ක්‍රියාත්මක කිරීම:

(එ) නිවාස පිළිබඳ කාරණා සම්බන්ධයෙන් පුහුණු කිරීමේ වැඩපිළිවෙලවල්, සම්මන්ත්‍රණ හා සාකච්ඡා පැවැත්වීම:

(ඒ) සම්මත සාධන පත්‍ර සහ ලේඛන පිළියෙල කිරීමට අදාළ සහාය ද ඇතුළුව, නිවාස මූල්‍ය සංස්ථාවලට තාක්ෂණික හා කළමනාකරණ සහාය ලබා දීම:

(ඔ) රජයේ හෝ මහ බැංකුවේ නියෝජිතයකු වශයෙන් ක්‍රියා කිරීම:

(ඕ) නිවාස මූල්‍ය සංස්ථාවල මූල්‍ය වගකීම් සහතික කිරීම සහ නිවාස මූල්‍ය සංස්ථාවල සහ නිවාස යෝජනා ක්‍රම අරමුණ වන සමාගම් වල ස්කන්ධ, කොටස්, බැදුම්කර, ණය පත්‍ර සහ සුරැකුම් පත් නිකුත් කිරීම, ප්‍රතිරක්ෂණය කිරීම:

(ක) යම් නිවාස මූල්‍ය සංස්ථාවක් විසින් වෙනත් යම් තැනැත්තකු සමග ඇතුළත් වූ යම් උකසක් යටතේ වූ ඒ නිවාස මූල්‍ය සංස්ථාවේ අයිතිවාසිකම් මිළ දී ගැනීම.

සංස්ථාවේ බලතල.

13. මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා, මණ්ඩලයට පහත සඳහන් බලතල තිබිය යුතු ය:—

(අ) පුද්ගලයන්ට හා නිවාස මූල්‍ය සංස්ථාවලට ණය හෝ මූල්‍ය ආධාර ප්‍රදානය කිරීම:

(ආ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම උකස් කිරීම, හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම:

(ඇ) සියලු ගිවිසුම්වලට හෝ එකඟවීම්වලට, කෙළින්ම හෝ තත් කාර්ය සඳහා බලය දෙන ලද යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මගින් ඇතුළුව ඒ ගිවිසුම් හා එකඟවීම් ඉටු කිරීම:

(ඈ) ඒ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් හා සේවකයන් සේවයෙහි නියුක්ත කිරීම:

(ඉ) මණ්ඩලයේ නිලධරයන් හා සේවකයන් පත් කිරීම, උසස් කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම, ඔවුන්ගේ විනය පාලනය හා ඔවුන්ට නිවාඩු ලබාදීම ද ඇතුළුව ඒ නිලධරයන්ට හා සේවකයන්ට අදාළව රීති සෑදීම:

(ඊ) මණ්ඩලයේ නිලධරයන් හා සේවකයන් සඳහා අර්ථසාධක අරමුදලක් හෝ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් පිහිටුවීම: ඒ අරමුදලට හෝ යෝජනා ක්‍රමයට දායක මුදල් ගෙවීම සහ ඒ නිලධරයන්ට හා සේවකයන්ට සුභ සාධක සහ ක්‍රීඩා පහසුකම් සැලසීම:

(උ) සංස්ථාව විසින් සලසනු ලබන යම් සේවා සම්බන්ධයෙන් අය කිරීම් කිරීම:

(ඌ) නිවාස මූල්‍ය සංස්ථාවලට ප්‍රදානය කරනු ලබන යම් ණය හෝ මූල්‍ය පහසුකම් සහතික කිරීම:

(එ) නිවාස මූල්‍ය සංස්ථාවල හා නිවාස සංවර්ධනය අරමුණ වන සමාගම්වල, කොටස්, බැඳුම්කර, ණය පත්‍ර හා සුරැකුම් පත් නිකුත් කිරීම ප්‍රතිරක්ෂණය කිරීම:

(ඒ) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් කාල සීමා සඳහා මහජනයාගෙන් වාර තැන්පතු භාරගෙන ඒ තැන්පතු මත පොලී ගෙවීම:

(ඔ) මණ්ඩලය විසින් සුදුසු යයි සලකනු ලබන යම් සුරැකුම්වල සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීම:

(ඕ) ස්ථිරසාර මූල්‍ය පරිචය ලෙස පිළිගෙන ඇත්තා වූ සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන්නා වූ නියම සහ කොන්දේසි මත මුදල් ණයට ගැනීම:

(ක) මුදලින් හෝ අන්‍යාකාරයකින් ත්‍යාග, ප්‍රදාන හා පරිත්‍යාග ලබා ගැනීම සහ ඒවා ඒ කාර්ය සඳහා යොදා ගැනීම.

## III වන කොටස

## සංස්ථාවේ නිලධරයෝ සහ කාර්ය මණ්ඩලය

14. (1) මණ්ඩලය විසින් නියම කරනු ලබන යම් වැටුපක් හා යම් දීමනා මත, අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව, සංස්ථාවේ කාර්ය මණ්ඩලයට සාමාන්‍යාධිකාරිවරයකු මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු ය. සාමාන්‍යාධිකාරිවරයා පත් කිරීම සහ ඔහුගේ බලතල.

(2) සාමාන්‍යාධිකාරිවරයා සංස්ථාවේ පූර්ණකාලීන නිලධරයකු විය යුතු අතර, ඔහු සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධරයා ද විය යුතු ය.

(3) මණ්ඩලය විසින් අන්‍යාකාරයෙන් විධාන කරනු ලැබ ඇත්නම් මිස, සාමාන්‍යාධිකාරිවරයා මණ්ඩලයේ සෑම රැස්වීමකටම පැමිණ සිටිය යුතු වුව ද ඔහුට ඡන්දය දීමේ අයිතිවාසිකම නොතිබිය යුතු ය.

මණ්ඩලයේ නිලධරයෝ සහ සේවකයෝ.

15. (1) මේ පනතේ විධිවිධාන ක්‍රියාවේ යෙදීමේ කාර්ය සඳහා මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකන වෙනත් යම් නිලධරයන් හා සේවකයන් මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලය විසින් රජයට අයත් සමාගම්වලට අදාළ වැටුප් පරිමාණවලට හා දීමනාවලට අදාළ ආණ්ඩුවේ යම් චක්‍රලේඛ වලට යටත්ව, කලින් කල ඒ නිලධරයන්ගේ හා සේවකයන්ගේ වැටුප් හා දීමනා නියම කිරීම සහ වෙනස් කිරීම, කළ හැකි ය.

(3) ඇප තබන ලෙස මණ්ඩලය විසින් නියම කරනු ලබන සෑම නිලධරයකු හෝ සේවකයකු විසින්, ඔහුගේ කාර්ය නිසි ලෙස සහ විශ්වසනීය ලෙස ඉටු කිරීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත් වන ඇපයක් තැබිය යුතු ය.

(4) සංස්ථාවේ කිසිදු අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු හෝ සේවකයකු සංස්ථාව විසින් වෙනත් යම් තැනැත්තකුට දී ඇති යම් ණය මුදලක් ආපසු ගෙවීම සම්බන්ධයෙන් ඇප සහතිකයක් නොදිය යුතු ය.

## IV වන කොටස

## මුදල්

සංස්ථාවේ ප්‍රාග්ධනය.

16. (1) සංස්ථාවේ බලය ලත් ප්‍රාග්ධනය, එක් එක් කොටස රුපියල් එක් සියයක් වූ කොටස් මිලියන විස්සකට බෙදනු ලැබූ රුපියල් මිලියන දෙදහසක් විය යුතු ය.

(2) (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ නිකුත් කළ ප්‍රාග්ධනය රුපියල් මිලියන එක් දහසක් විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සංස්ථාව විසින් කොටස් නිකුත් කිරීම මගින්, සංස්ථාවේ ප්‍රාග්ධනයට දායක මුදල් වශයෙන් මුදල් ලබා ගත හැකි ය.

**17.** (1) නියමිත දිනයේ සිට අවුරුදු පහක් ඇතුළත, මෙහි පහත I වන තීරයේ දක්වා ඇති සෑම ආයතනයක් විසින් ම, මෙහි පහත II වන තීරයේ අනුරූප සටහනේ දක්වා ඇති මුදලට සමාන මුදලක්, සංස්ථාවේ ප්‍රාග්ධනයට දයක මුදල් වශයෙන් ගෙවනු ලැබිය යුතු යː— අරමුදලට දයක මුදල්.

| *I වන තීරය* | *II වන තීරය* |
| --- | --- |
| සෙවන අරමුදල | මුදලින් රුපියල් මිලියන පන්සියයක් |
| ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | මුදලින් රුපියල් මිලියන සියයක් |
| සේවා නියුක්තයන්ගේ භාර අරමුදල | මුදලින් රුපියල් මිලියන පනහක්. |

ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් නියමිත දිනයෙන් එක් වර්ෂයක් ඇතුළත මුදලින් රුපියල් මිලියන එක්සියයක් නොඉක්මවන මුදලක් සංස්ථාවේ අරමුදලට දයක මුදල් වශයෙන් ගෙවිය හැකි ය.

(2) සීමාසහිත ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව වශයෙන් (401 වන අධිකාරය වූ) ජාතික නිවාස පනත යටතේ ලියාපදිංචි කරන ලද ගොඩනැගිලි සංගමයේ සාමාජිකයන් විසින් එහි වත්කම් හා බැරකම් සංස්ථාව වෙත පැවරීමට යෝජනා සම්මත කිරීමේ දී, ඒ යෝජනා සම්මත කිරීමේ දිනයට ඉහතින් වූ දිනයේ දී සීමාසහිත ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ කොටස් දැරූ සෑම තැනැත්තකුට ම, ඒ දිනයේ දී සීමාසහිත ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ ඒ තැනැත්තා දැරූ කොටස්වල වටිනාකමට සමාන වටිනාකමින් යුත් කොටස්, සංස්ථාවේ වෙන් කර දෙනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ කොටස් වෙන් කිරීමෙන් පසු, 16 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් කොටස්වලින් ඉතිරි කොටස්, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් ආකාරයකට මහජනයා වෙත විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ මහජනයා වෙත කොටස් විකිණීම අවසන් වීමෙන් පසු, (1) වන උපවගන්තියේ සඳහන් ආයතන විසින් ඒ උපවගන්තිය යටතේ සංස්ථාවේ ප්‍රාග්ධනයට ගෙවනු ලැබූ ඒ ඒ දායක මුදල්, සංස්ථාව විසින් ඒ ආයතන වෙත ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(5) (1) (අ) යම් කොටස් වෙන් කිරීමක හෝ ලියාපදිංචි කිරීමක ප්‍රතිඵලය වශයෙන් යම් සමාගමකට, සංස්ථාගත කරන ලද මණ්ඩලයකට හෝ පුද්ගලයකුට සංස්ථාවේ නිකුත් කළ මුළු කොටස් ප්‍රාග්ධනයෙන් සියයට පහළොවකට වැඩි ප්‍රමාණයක් අයත් වන්නේ නම්, ඒ සමාගමේ, සංස්ථාගත කරන ලද මණ්ඩලයේ හෝ පුද්ගලයාගේ නමට:

(ආ) යම් සමාගමක නමට සහ පහත සඳහන් සමාගමේ, එනම්—

(i) ඒ සමාගමේ පාලිත සමාගම් අතුරින් යම් පාලිත සමාගමක්:

(ii) ඒ සමාගමේ පාලක සමාගම:

(iii) ඒ සමාගමේ පාලක සමාගමේ පාලිත සමාගමක්: හෝ

(iv) ඒ සමාගමේ හෝ ඒ සමාගමේ පාලිත සමාගමක් හෝ ඒ සමාගමේ පාලක සමාගම හෝ ඒ සමාගමේ පාලක සමාගමේ පාලිත සමාගමක් හෝ සැහෙන සම්බන්ධතාවක් දරන්නා වූ යම් සමාගමක්

යන සමාගම් අතුරින් එක් සමාගමක හෝ සමාගම් වැඩි ගණනක නමට කොටස් වෙන් කිරීමේ හෝ ලියාපදිංචි කිරීමේ ප්‍රතිඵලය වශයෙන්, ඒ සමාගමට සහ (i), (ii), (iii) සහ (iv) වන අනුඡේදවල සඳහන් සමාගම් අතුරින් එක් සමාගමකට හෝ සමාගම් වැඩි ගණනකට සංස්ථාවේ නිකුත් කළ මුළු කොටස් ප්‍රාග්ධනයෙන් සියයට පහළොවකට වැඩි ප්‍රමාණයක් අයත්වන්නේ නම්, ඒ සමාගමේ හා පසුව සඳහන් සමාගම් අතුරින් එක් සමාගමක හෝ සමාගම් වැඩි ගණනක නමට:

(ඇ) පුද්ගලයකුගේ නමට සහ පහත සඳහන් පුද්ගලයන්, සමාගම් හෝ සංස්ථාගත කරන ලද මණ්ඩල, එනම්—

(i) ඔහුගේ කිට්ටු ඥාතීන්:

(ii) ඔහුට සැහෙන සම්බන්ධතාවක් ඇති හෝ ඔහුගේ කිට්ටු ඥාතියාට සැහෙන සම්බන්ධතාවක් ඇති සමාගමක්:

(iii) (ii) වන අනුඡේදයේ සඳහන් සමාගමක පාලිත සමාගමක්:

(iv) (ii) වන අනුඡේදයේ සඳහන් සමාගමක පාලක සමාගම:

(v) (ii) වන අනුඡේදයේ සඳහන් සමාගමක පාලක සමාගමේ පාලිත සමාගමක්:

(vi) (ii) වන අනුඡේදයේ සඳහන් සමාගමක් හෝ එහි පාලිත සමාගමක් හෝ එහි පාලක සමාගම හෝ එහි පාලක සමාගමේ පාලිත සමාගමක් සැහෙන සම්බන්ධතාවක් දරන සමාගමක:

(vii) ඒ පුද්ගලයාට හෝ ඔහුගේ කිට්ටු ඥාතියාට සැහෙන සම්බන්ධතාවක් ඇති, සමාගමක් නොවන, වෙනත් සංස්ථාගත කරන ලද මණ්ඩලයක

යන පුද්ගලයන්, සමාගම් හෝ සංස්ථාගත කරන ලද මණ්ඩල අතුරින් එක් පුද්ගලයකුගේ, සමාගමක හෝ සංස්ථාගත කරන ලද මණ්ඩලයක හෝ පුද්ගලයන්, සමාගම් හෝ සංස්ථාගත කරන ලද මණ්ඩල වැඩි ගණනක නමට කොටස් වෙන් කිරීමේ හෝ ලියාපදිංචි කිරීමේ ප්‍රතිඵලය වශයෙන් සමස්ත වශයෙන් ඒ පුද්ගලයාට සහ (i), (ii), (iii), (iv), (vi) සහ (vii) වන අනුඡේදවල සඳහන් පුද්ගලයන්, සමාගම් හෝ සංස්ථාගත කරන ලද මණ්ඩල අතුරින් එක් පුද්ගලයකුට, සමාගමකට හෝ සංස්ථාගත කරන ලද මණ්ඩලයකට හෝ පුද්ගලයන්, සමාගම් හෝ සංස්ථාගත කරන ලද මණ්ඩල වැඩි ගණනකට සංස්ථාවේ නිකුත් කළ මුළු කොටස් ප්‍රාග්ධනයෙන් සියයට පහළොවකට වැඩි ප්‍රමාණයක් අයත් වන්නේ නම්, ඒ තැනැත්තාගේ හා පසුව සඳහන් පුද්ගලයන්, සමාගම් හෝ සංස්ථාගත කරන ලද මණ්ඩල අතුරින් එක් පුද්ගලයකුගේ, සමාගමක හෝ සංස්ථාගත කරන ලද මණ්ඩලයක හෝ ඉන් වැඩි ගණනක නමට

සංස්ථාව විසින් කොටස් කිසිවක් වෙන් කිරීම හෝ ලියාපදිංචි කිරීම කරනු නොලැබිය යුතු ය.

යම් සමාගමකට හෝ පුද්ගලයකුට, අවස්ථාවෝචිත පරිදි, මේ උපවගන්තියේ අර්ථානුකූලව වූ සමාගමක් නොවන සමාගමක හෝ සංස්ථාගත කරන ලද මණ්ඩලයක කොටස්

වලින් සියයට පනස් එකකට වැඩි ප්‍රමාණයක් අයත් වන අවස්ථාවක, මුලින් සඳහන් කළ සමාගමට හෝ පුද්ගලයාට පසුව සඳහන් කළ සමාගමේ හෝ සංස්ථාගත කරන ලද මණ්ඩලයේ සැහෙන සම්බන්ධතාවක් ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා—

"කිට්ටු ඥතියා" යන්න යම් තැනැත්තකු සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ තැනැත්තාගේ දෙමව්පියන්ගෙන් කෙනකු, කලත්‍රයා හෝ ළමයකු හෝ ඒ තැනැත්තාගේ ළමයකුගේ කලත්‍රයා හෝ ඉන් අදහස් වේ;

"පාලිත සමාගම" යන්නෙහි 1988 අංක 30 දරන බැංකු පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

කොටස් හිමියන්ගේ වගකීම.

**18.** සංස්ථාවේ යම් කොටස් හිමියකුගේ වගකීම, ඔහුගේ කොටස් මත නොගෙවා ඇති යම් කොටසක් වේ නම්, ඒ කොටසට සීමා වන්නේ ය.

සංස්ථාවේ සාමාන්‍ය ණයට ගැනීමේ බලතල.

**19.** සංස්ථාව විසින්, මේ පනතේ විධිවිධාන යටතේ සහ ඒ විධිවිධානවලට අනුකූලව, සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය හා කර්තව්‍ය ඉටුකිරීම පිණිස අවශ්‍ය විය හැකි මුදල්, ණයක් වශයෙන් හෝ අන්‍යාකාරයකින් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත දී ලබා ගත හැකි ය.

ආණ්ඩුවෙන් මුදල් ණයට ගැනීම.

**20.** ආණ්ඩුව විසින් නිශ්චය කරනු ලබන යම් නියම හා කොන්දේසිවලට යටත්ව, සංස්ථාව විසින් කලින් කල ආණ්ඩුවෙන් මුදල් ණයට ලබා ගැනීම ද ආණ්ඩුව විසින් කලින් කල යම් ණය මුදලක් ඒකාබද්ධ අරමුදලින් සංස්ථාවට ණයදීම ද කරනු ලැබිය හැකි ය.

විදේශ ආණ්ඩු ආදීන්ගෙන් මුදල් ණයට ගැනීම.

**21.** සංස්ථාව විසින්, මුදල් මණ්ඩලයේ අනුමතය ඇතිව, කලින් කල, යම් විදේශ ආණ්ඩුවකින් හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වෙනත් කවර හෝ ප්‍රභවයකින් යම් ණය මුදලක්, අවස්ථාවෝචිත පරිදි, සංස්ථාව හා ඒ ආණ්ඩුව හෝ වෙනත් ප්‍රභවය අතර එකඟවීමෙන් නිශ්චය කරනු ලබන, ඒ ණය මුදල මත පොළිය සහ එය ආපසු ගෙවීම සම්බන්ධයෙන් වූ නියම හා කොන්දේසි මත ලබා ගත හැකි ය.

සෑණ පත්‍ර සහ ස්කන්ධ.

**22.** (1) මණ්ඩලය විසින් සෑණ පත්‍ර හා ස්කන්ධ ඇති කර නිකුත් කරනු ලැබිය හැකි අතර, එසේ ඇති කර නිකුත් කරනු ලබන සෑණ පත්‍ර හා ස්කන්ධ මේ පනතෙහි පිළිවෙළින් "නිවාස

සංවර්ධන මූල්‍ය සංස්ථා ණය පත" සහ "නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු ස්කන්ධ" යනුවෙන් සඳහන් කරනු ලැබිය යුතු ය.

(2) නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා ණය පත්‍ර සහ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු ස්කන්ධ, නිකුත් කිරීම, පැවරීම, ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම, නිදහස් කර ගැනීම හෝ අවලංගු කිරීම, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන නියම හා කොන්දේසි වලට අනුකූලව කරනු ලැබිය යුතු ය.

ආපසු ගෙවීම ආදිය ආණ්ඩුව විසින් සහතික කිරීම.

**23.** (1) මුල් මුදල ආපසු ගෙවීම සහ—

(අ) මණ්ඩලය විසින් 22 වන වගන්තිය යටතේ ඇති කර නිකුත් කරන ලද නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා ණය පත්‍ර සහ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකු ස්කන්ධ මත:

(ආ) 21 වන වගන්තිය යටතේ යම් විදේශ ආණ්ඩුවකින් හෝ වෙනත් ප්‍රභවයකින් සංස්ථාව ලබාගත් යම් ණය මුදලක් මත:

පොලිය ගෙවීම ආණ්ඩුව විසින් සහතික කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ විධිවිධාන සලසා ඇති යම් සහතික වීමක් ඉටු කිරීම සඳහා අවශ්‍ය යම් මුදලක් ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සහතික කිරීමක් දෙනු ලැබූ වහාම, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් ඒ සහතික කිරීම පිළිබඳ ප්‍රකාශයක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) එවැනි යම් සහතික කිරීමක් ඉටු කිරීමෙහි ලා ඒකාබද්ධ අරමුදලින් යම් මුදලක් ගෙවනු ලැබූ අවස්ථාවක, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් ඒ මුදල එසේ ගෙවන ලද බවට ප්‍රකාශයක්, පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල්.

**24.** (1) සංස්ථාවට—

(අ) සංස්ථාවේ ප්‍රාග්ධනයට දායක මුදල් වශයෙන්:

(ආ) සංස්ථාවේ කර්තව්‍ය ඉටු කිරීමේ දී:

(ඇ) සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කාර්ය ඉටු කිරීමේ දී

ලැබුණු සියලු මුදල්, සංස්ථාවේ අරමුදල්වලට බැර කරනු ලැබිය යුතු ය.

(2) (අ) සංස්ථාවේ කර්තව්‍ය කිරීමේ දී;

(ආ) සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය ඉටු කිරීමේ දී

පැන නැගෙන හෝ ඒ සම්බන්ධයෙන් සංස්ථාව විසින් දරනු ලබන සියලු මූල්‍යමය වගකීම් හෝ බැරකම් සංස්ථාවේ අරමුදල් වලින් ගෙවනු ලැබිය යුතු ය.

ලාභාංශ ප්‍රකාශ කිරීම පිළිබඳව සීමා කිරීම.

**25.** යම් මුදල් වර්ෂයක් සඳහා සංස්ථාවේ ලාභවලින් නියමිත සියයට දහයක් නොඉක්මවන යම් ප්‍රතිශතයක් සංස්ථාවේ සංචිතයට මාරු කිරීමෙන් පසුව හැර, ඒ වර්ෂය සඳහා ක්ෂය වීම සම්බන්ධයෙන් නියම කර ඇති විධිවිධානවලට අනුකූලව ඒ සඳහා කටයුතු සැලසීමෙන් පසුව ගණන් බලන ලද සංස්ථාවේ ලාභවලින්, ඒ වර්ෂය සඳහා සංස්ථාව විසින් කිසිම ලාභාංශයක් ප්‍රකාශයට පත් කිරීම හෝ ගෙවීම කරනු නොලැබිය යුතු ය:

එසේ වුවද සංස්ථාව විසින් එහි ලාභවලින් වැඩි ප්‍රතිශතයක් එහි සංචිතය වෙත කැමැත්තෙන් ම මාරු කිරීම, මේ වගන්තියෙහි ඇතුළත් කිසිවකින් තහනම් වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

V වන කොටස

## ගිණුම් හා විගණනය

ගිණුම් විගණනය කිරීම.

**26.** (1) සංස්ථාවේ ගිණුම්, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් අන්දමකින් හා ආකාරයකින් තබා ගැනීමට මණ්ඩලය විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම්, සංස්ථාවේ කොටස් හිමියන්ගේ රැස්වීමක දී පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය:

එසේ වුවද, සංස්ථාවේ නිකුත් කළ කොටස්වලින් බහුතරය ශ්‍රී ලංකා ආණ්ඩුව හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් දරනු ලබන තාක්කල්, සංස්ථාවේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ විගණකවරයාට ගෙවිය යුතු පාරිශ්‍රමිකය, සංස්ථාවේ කොටස් හිමියන් විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ විගණකවරයාට සංස්ථාවේ වාර්ෂික ශේෂ පත්‍රයේ පිටපතක් සපයනු ලැබිය යුතු අතර, ඒ ශේෂ පත්‍රය, එයට අදාළ ගිණුම් සහ වවුචර සමඟ පරීක්ෂා කිරීම ඔහුගේ කාර්යය වන්නේ ය. විගණකවරයාට සියලු අවස්ථාවන්හි දී සංස්ථාවේ පොත්, ගිණුම් සහ වවුචර් ලබා ගැනීමට හැකි විය යුතු අතර, ස්වකීය කාර්ය ඉටු කිරීම පිණිස අවශ්‍ය විය හැකි යම් තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබා දෙන ලෙස සංස්ථාවේ අධ්‍යක්ෂවරයන්ට හා නිලධරයන්ට නියම කිරීමට ඔහුට හිමිකම ඇත්තේ ය.

(5) සංස්ථාවේ ගිණුම් සම්බන්ධයෙන් නොකඩවා විගණනයක් කිරීමට සංස්ථාවේ විගණකවරයා අපේක්ෂා කරන්නේ නම්, ඔහු විසින් එසේ කරනු ලැබිය හැකි ය.

(6) සංස්ථාවේ විගණකවරයා විසින්, සංස්ථාවේ වාර්ෂික ශේෂ පත්‍රය සහ ගිණුම් පිළිබඳව ලිඛිත වාර්තාවක් පිළියෙල කළ යුතු අතර, සංස්ථාවේ පොත් සහ ගිණුම් තමාට ලබා ගැනීමට හැකිවූයේ ද නැද්ද යන කරුණු ද, තමාට අවශ්‍ය වූ සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් තමාට ලබා ගැනීමට හැකි වූයේ ද නැද්ද යන කරුණ ද, ඔහුගේ මතය අනුව ඒ ගිණුම්, ඔහුට ලැබී ඇති උපරිම තොරතුරු හා ඉදිරිපත් කර ඇති පැහැදිලි කිරීම් අනුව සහ සමාගමේ පොත් වලින් දැක්වෙන අන්දමට සංස්ථාවේ කටයුතු පිළිබඳව සත්‍ය හා නිවැරදි ප්‍රතිරූපයක් පෙන්නුම් වන පරිදි නිසි පරිදි සාදා තිබේ ද නොතිබේ ද යන කරුණ ද, ඒ වාර්තාවෙහි සඳහන් විය යුතු ය.

(7) සංස්ථාවේ විගණකවරයාගේ වාර්තාව, ඔහු විසින් මණ්ඩලය වෙත යවනු ලැබිය යුතු ය.

(8) සංස්ථාවේ විගණකවරයාගේ වාර්තාවේ පිටපතක්, ශේෂ පත්‍රයේ පිටපතක් හා ඒ වාර්තාව අදාළ වන ලාභාලාභ ගිණුමේ පිටපතක් ද සමඟ එක් එක් තොටස්හිමියා හා මුදල් විෂයය භාර අමාත්‍යවරයා වෙත යැවීමට මණ්ඩලය විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(9) සංස්ථාවේ මුදල් වර්ෂය ලින් වර්ෂය විය යුතු ය.

(10) මේ වගන්තියෙහි "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්: හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි යම් ගණකාධිකාරී සමාගමක්

අදහස් වේ.

VI වන කොටස

**සාමාන්‍ය**

සංස්ථාවේ රීති.

**27.** (1) මේ පනතින් විධිවිධාන සලසා නොමැති කාරණා සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි අතර, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ පිහිටුවන ලද සමාගමක් සම්බන්ධයෙන් වන විට ඒ කාරණා සම්බන්ධයෙන් ඒ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය මගින් ක්‍රියා කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ විධිවිධානවලට යටත් ව, (1) වන උපවගන්තිය යටතේ සාදන ලද යම් රීතියක්, කොටස් හිමියන් විසින් විශේෂ යෝජනා සම්මතයක් මගින් සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම හෝ ඒ රීතිවලට යමක් එකතු කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

මේ උපවගන්තියෙහි "විශේෂ යෝජනා සම්මතය" යන යෙදුමෙන් කොටස් හිමියන්ගේ රැස්වීමක දී ඡන්දය දීමට හිමිකම් ඇති කොටස් හිමියන්ගේ පෞද්ගලිකව හෝ ප්‍රතියුක්තයකු මගින් දෙනු ලබන හතරෙන් තුනකට නොඅඩු වැඩි ඡන්දයෙන් සම්මත කර ගනු ලබන යෝජනා සම්මතයක් අදහස් වේ. ඒ රැස්වීමේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරනු ලබන යෝජනා සම්මතය නිශ්චිතව සඳහන් කරමින් ඒ කොටස්හිමියන් වෙත දින විසි එකකට නොඅඩු කල් තබා දැනුම් දීමක් කරනු ලැබිය යුතු ය.

1982 අංක 17 දරන සමාගම් පනත, සංස්ථාවට අදාළ වීම.

**28.** මේ පනතෙහි හෝ 27 වන වගන්තිය යටතේ සාදන ලද යම් රීතියකින් විධිවිධාන කිසිවක් සලසා නොමැති කාරණයක් සම්බන්ධයෙන් 1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, සංස්ථාව කෙරෙහි අදාළ විය යුතු යඃ

එසේ වුව ද ඒ පනත යටතේ සංස්ථාව ලියාපදිංචි කිරීම අවශ්‍ය නොවිය යුතු අතර, සංස්ථාව සම්බන්ධයෙන් සමාගම් රෙජිස්ට්‍රාර්වරයාට යම් බලයක් නොතිබිය යුතු ය.

ඇතැම් නීති සංස්ථාවට අදාළ නොවිය යුතු බව.

**29.** (81 වන අධිකාරය වූ) ණය සහන ආඥාපනතේ විධිවිධාන සහ (80 වන අධිකාරය වූ) මුදල් ණයට දීමේ ආඥාපනතේ විධිවිධාන, සංස්ථාවට සහ සංස්ථාව සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

පළාත් පාලන වරිපනම් අධිකාරීවල තක්සේරු ලැයිස්තු පරීක්ෂා කිරීමට ඇති බලය.

**30.** ණය මුදලක් සඳහා ඇපයක් වශයෙන් ඉදිරිපත් කර ඇති යම් නිශ්චල දේපළක් සංස්ථාව විසින් පිළිගත යුතු ද නැද්ද යන කාරණය තීරණය කිරීමේ කාර්යය සඳහා, යම් පළාත් පාලන වරිපනම් අධිකාරියක තක්සේරු ලැයිස්තු අය කිරීමකින් තොරව සංස්ථාවට ලබා ගැනීමට හැකි විය යුතු අතර, එවැනි සෑම අධිකාරියක ම නිලධරයන් විසින්, තත්කාර්ය සඳහා කරනු ලබන ඉල්ලීමක් මත, ඒ පළාත් පාලන වරිපනම් අධිකාරියට වරිපනම් අය කිරීමට බලය ඇති වරිපනම් අය කළ හැකි දේපළ සම්බන්ධයෙන් වන යම් තක්සේරුවක් පිළිබඳව සම්පූර්ණ විස්තර සංස්ථාව වෙත සපයනු ලැබිය යුතු ය.

විනිමය බිල්පත්‍ර හා පොරොන්දු නෝට්ටු.

**31.** මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති පරිදි තත්කාර්ය සඳහා යථා පරිදි බලය දෙන ලද යම් තැනැත්තකු විසින් යම් විනිමය බිල් පත්‍රයක් හෝ පොරොන්දු නෝට්ටුවක් සංස්ථාවේ නමින්, සංස්ථාව විසින් හෝ වෙනුවෙන් හෝ සංස්ථාව සඳහා සාදන ලද නම්, ලියා අත්සන් කරන ලද නම් හෝ පිටසන් කරන ලද නම් ඒ විනිමය බිල්පත්‍රය හෝ පොරොන්දු නෝට්ටුව සංස්ථාව වෙනුවෙන් සාදනු ලැබූ ලෙස, ලියා අත්සන් කරනු ලැබූ ලෙස හෝ පිටසන් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

සංස්ථාව වෙනුවෙන් ක්‍රියා කිරීමට බලය ඇති තැනැත්තෝ.

**32.** මණ්ඩලය විසින් ප්‍රකාශිතව ම බලය දෙන ලද හා තමා වෙත පවරන ලද බලයේ සීමා ඇතුළත ක්‍රියා කරන අධ්‍යක්ෂවරයකු හෝ සංස්ථාවේ නිලධරයකු නොවන කිසිම තැනැත්තකු විසින්, සංස්ථාවේ නමින් හෝ සංස්ථාව වෙනුවෙන් හෝ යම් පොරොන්දු නෝට්ටුවක්, විනිමය බිල් පත්‍රයක්, චෙක් පතක් හෝ මුදල් ගෙවීම සඳහා වූ ඇනවුමක් සෑදීමට, ලිවීමට, භාර ගැනීමට හෝ පිටසන් කිරීමට හෝ සංස්ථාව වෙත යම් වගකීමක් පැවරෙන පරිදි හෝ අන්‍යාකාරයකින් සංස්ථාවේ නාමය ඇපයට තබා යම් ගිවිසුමකට ඇතුළත්වීමට හෝ බලය නොතිබිය යුතු ය.

සාක්ෂි ආඥා පනතේ VI වන පරිච්ඡේදය, සංස්ථාවට අදාළ වීම.

**33.** සංස්ථාව විසින් ඉල්ලූ විට ගෙවන තැන්පතු භාර නොගන්නා නමුත්, සාක්ෂි ආඥාපනතේ VI වන පරිච්ඡේදයේ අර්ථානුකූලව සංස්ථාව බැංකුවක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, ඒ පරිච්ඡේදයේ විධිවිධාන, සංස්ථාවට හා සංස්ථාව සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

රහස්‍යතාව.

**34.** (1) සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු ම, නිලධරයකු ම හෝ විගණකවරයා විසින්, ස්වකීය කාර්ය භාර ගැනීමට පෙර සංස්ථාවේ සියලු ගනුදෙනු හා ඒ ගනුදෙනුවලට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් දැඩි රහස්‍යතාව පිළිපදින බවට පොරොන්දු වෙමින් ප්‍රකාශයක් අත්සන් කරනු ලැබිය යුතු අතර, ඒ ප්‍රකාශයෙන්, එවැනි යම් ගනුදෙනුවක් හෝ කාරණයක්—

(අ) මණ්ඩලය විසින් හෝ අධිකරණයක් විසින් හෝ ඒ ගනුදෙනුව හෝ කාරණය අදාළ වන තැනැත්තා විසින් හෙළිදරව් කරන ලෙස ඉල්ලා සිටි විට:

(ආ) මේ පනත යටතේ වූ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී: සහ

(ඇ) මේ පනතේ හෝ වෙනත් යම් නීතියක යම් විධිවිධානයක් අනුව ක්‍රියා කිරීමේ දී

හැර, හෙළිදරව් නොකරන බවට, පොරොන්දු විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සංස්ථාවේ යම් අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ විගණකවරයා විසින් දී ඇති රහස්‍යතාව පිළිබඳ පොරොන්දුව කඩ නොකර සංස්ථාවේ කටයුතුවලට අදාළ යම් ප්‍රශ්නයකට පිළිතුරු දිය නොහැකි නම්, ඒ අධ්‍යක්ෂවරයා, නිලධරයා හෝ විගණකවරයා විසින් ඒ ප්‍රශ්නයට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කළ යුතු ය.

වාර්ෂික මහා සභා රැස්වීම.

**35.** සංස්ථාවේ කොටස්හිමියන්ගේ වාර්ෂික මහා සභා රැස්වීමක්, සංස්ථාවේ එක් එක් මුදල් වර්ෂය අවසන්වීමෙන් පසු මාස නවයක් ඇතුළත පවත්වනු ලැබිය යුතු ය. ඒ මහා සභා රැස්වීමේ දී, මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන වාර්ෂික වාර්තාව සහ ගිණුම් සලකා බැලිය යුතු අතර, ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම පිළිබඳව තීරණ ගනු ලැබිය යුතු ය. වාර්ෂික මහා සභා රැස්වීම කැඳවන ආකාරය සහ ඒ රැස්වීමේ දී කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නියමිත '

විය යුතු ය. සෑම වාර්ෂික මහා සභා රැස්වීමක දී ම, ඒ රැස්වීමේ දිනයට ඉහතින් ම වූ දිනයේ දී සංස්ථාවේ කොටස් දැරීමට අනුකූලව මණ්ඩලයට අධ්‍යක්ෂවරයන් තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

36. සංස්ථාව දැරීමට සිදු වූ යම් අලාභයක් හෝ පාඩුවක් සංස්ථාවේ යම් අධ්‍යක්ෂවරයකුගේ හෝ නිලධරයකුගේ විෂමාචාරය නිසා වූ හෝ හිතාමතාම සිදු කරන ලද අලාභයක් හෝ පාඩුවක් නම් මිස, අලාභය හෝ පාඩුව සඳහා ඒ අධ්‍යක්ෂවරයා හෝ නිලධරයා වගකිව යුතු නොවන්නේ ය. නඩු පැවරීමෙන් ආරක්ෂාව.

37. (1) (අ) 17 (5) වන වගන්තියේ විධිවිධාන කඩ කරමින් යම් තැනැත්තකුට හෝ ඒ තැනැත්තාගේ නමින් සංස්ථාවේ කොටස් කිසිවක් දැන දැනම වෙන් කරන හෝ ලියාපදිංචි කරන; වැරදි.

(ආ) 17 (5) වන වගන්තියේ විධිවිධාන කඩ කරමින් යම් තැනැත්තකුට හෝ තැනැත්තාගේ නමින් සංස්ථාවේ කොටස් කිසිවක් දැන දැනම වෙන් කිරීමක්, ලියාපදිංචි කිරීමක් ලබාදෙන; හෝ

(ඇ) සංස්ථාවේ අධ්‍යක්ෂවරයකුව, නිලධරයකුව හෝ විගණකවරයකුව සිටියදී, සංස්ථාවේ යම් ගනුදෙනුවකට අදාළ යම් කාරණයක්, මේ පනත මගින් ඒ කාරණය හෙළි කිරීමට ඔහුට බලය දී ඇති කාර්යය නොවන වෙනත් කාර්යයක් සඳහා යම් තැනැත්තකුට හෙළි කරන

සෑම තැනැත්තකු ම, මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදුකරනු ලබන අවස්ථාවක—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් නම්, ඒ සංස්ථාගත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකුම සහ නිලධරයකු ම; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම්, ඒ ව්‍යාපාර ආයතනයේ සෑම හවුල්කරුවකු ම

ඒ වරදට වරදකරු යයි සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද ඒ සංස්ථාගත මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු හෝ ඒ ව්‍යාපාර ආයතනයේ හවුල්කරුවකු විසින්, ඒ වරද සිදු කරන ලද්දේ තමාගේ දැනුම නොමැතිව බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීම පිණිස තමා නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ බව ඔප්පු කරතහොත්, ඒ අධ්‍යක්ෂවරයා, නිලධරයා හෝ හවුල්කරු ඒ වරදට වරදකරු යයි සලකනු නොලැබිය යුතු ය.

නියෝග.

**38.** (1) නියමිත යයි මේ පනතින් නියම කර ඇති හෝ නියෝග සෑදීමට මේ පනතින් නියම කර ඇති හෝ යම් කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, නියෝගයේ සඳහන් යම් දිනයක හෝ එසේ දිනයක් සඳහන් කර නොමැති නම් එසේ පළ කරන ලද දිනයෙහි එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකි පහසු ඉක්මණින්, ඒ නියෝගය අනුමත කරන ලෙස ඉල්ලා සිටින මෝසමක් මගින්, පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන යම් නියෝගයක්, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවක වලංගු භාවය කෙරෙහි ඉන් හානියක් නොවිය යුතු ය. ඒ නියෝගය පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය, පාර්ලිමේන්තුව විසින් ඒ නියෝගය අනුමත කිරීම ප්‍රතික්ෂේප කරන ලද දිනය වන්නේ ය.

(5) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

සීමාසහිත ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ වත්කම් හා බැරකම් පැවරීම.

**39.** වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් ව ඇත ද, (401 වන අධිකාරය වූ) ජාතික නිවාස පනත යටතේ සීමාසහිත ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව වශයෙන් ලියාපදිංචි කර ඇති ගොඩනැගිලි සමිතියේ සාමාජිකයන් විසින්, එහි වත්කම්

හා බැරකම් සියල්ල ම සංස්ථාව වෙත පැවරීමට යෝජනා සම්මත කරනු ලැබිය හැකි අතර, එසේ යෝජනා සම්මත කරනු ලැබූ විට, සීමාසහිත ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ වත්කම් හා බැරකම් ඒ යෝජනා සම්මතයේ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි සංස්ථාව වෙත පැවරෙන්නේ ය. තවද ඒ දින සිට බලපැවැත්වෙන පරිදි, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව විසුරුවා හරිනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

**40.** සීමාසහිත ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව විසුරුවා හරිනු ලැබුවේ වුව ද—

(අ) සීමාසහිත ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව විසින් හෝ සීමාසහිත ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට විරුද්ධව පවරා ඇත්තා වූ ද මුල් අවස්ථා අධිකරණයක හෝ අභියාචනාධිකරණයක හෝ සීමාසහිත ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව විසුරුවා හරිනු ලැබුවේ යයි සලකන දිනයට ඉහතින් වූ දිනයේදී විනිශ්චයට භාජනයව පවත්නා සෑම නඩුවක් ම, කාරණයක් ම, නඩු කටයුත්තක් ම හෝ දෙයක් ම ඒ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි සංස්ථාව විසින් හෝ සංස්ථාවට විරුද්ධව පවරනු ලැබූ නඩුවක්, කාරණයක්, නඩු කටයුත්තක් හෝ දෙයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ සෑම නඩුවක් ම හෝ නඩු කටයුත්තක් ම අවසානය තෙක් දිගට ම පවත්වා ගෙන ගොස් ඒ අනුව ක්‍රියාවෙහි යොදවනු ලැබිය හැකි ය;

(ආ) යම් නඩුවක දී, කාරණයක දී, නඩු කටයුත්තක දී හෝ දෙයක දී යම් අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් හෝ විසින් සීමාසහිත ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ වාසියට හෝ ඊට විරුද්ධව හෝ ඇතුළත් කරනු ලැබූ හෝ කරනු ලැබූ ද සීමාසහිත ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව විසුරුවා හරින ලද්දේ යයි සලකනු ලබන දිනයට ඉහතින් වූ දිනයේ දී ඉටු නොකර පවත්නා වූ ද සෑම තීන්දු ප්‍රකාශයක්, ආඥාවක් හෝ ප්‍රදනයක් ම, ඒ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි සංස්ථාවේ වාසියට හෝ සංස්ථාවට විරුද්ධව ඇතුළත් කරන ලද හෝ කරන ලද තීන්දු ප්‍රකාශයක්, ආඥාවක් හෝ ප්‍රදානයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ක්‍රියාවෙහි යොදවනු ලැබිය හැකි ය.

1990 අංක 4 දරන පනතේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

**41.** 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 22 වන වගන්තියේ "බැංකුව" යන අර්ථ කථනයේ "(165 වන අධිකාරය වූ) ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව" යන වචන හා ඉලක්කම් වෙනුවට "(165 වන අධිකාරය වූ) ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව" සහ 1997 අංක  දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව පනතින් පිහිටුවන ලද "ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව" යන වචන හා ඉලක්කම් ආදේශ කරමින් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

සේවා නියුක්තියේ ආරක්ෂාව සහ වන්දි.

**42.** (1) (401 වන අධිකාරය වූ) ජාතික නිවාස පනත යටතේ ලියාපදිංචි කර ඇති සීමාසහිත ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව, විසුරුවා හරිනු ලැබූ දිනයට ඉහතින් වූ දිනයේ දී ඒ ආයතනයේ සිටි සෑම නිලධරයකුට ම සංස්ථාවේ සේවා නියුක්තිය පිරිනැමිය යුතු ය.

(2) සංස්ථාව විසින් සේවයේ නියුක්ත කරනු ලබන, එකී සීමාසහිත ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ සෑම නිලධරයකු හෝ සේවකයකු ම ඒ නිලධරයා හෝ සේවකයා සහ සංස්ථාව විසින් එකඟ වන්නා වූ නියම හා කොන්දේසි මත එසේ සේවයෙහි නියුක්ත කරනු ලැබිය යුතු ය.

(3) සංස්ථාව විසින් සේවයෙහි නියුක්ත කරනු නොලබන, සීමාසහිත ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ යම් නිලධරයකුට හෝ සේවකයකුට ඔහුට ලැබිය යුතු කිසියම් විශ්‍රාමික ප්‍රතිලාභයකට අතිරේකව, ඒ ආයතනයේ ඔහුගේ සේවයේ අවුරුදු ගණන සැලකිල්ලට ගෙන මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණයක වන්දියක් ගෙවනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**43.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**44.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"සභාපතිවරයා" යන්නෙන්, මණ්ඩලයේ සභාපතිවරයා අදහස් වේ:

"අධ්‍යක්ෂවරයා" යන්නෙන්, මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු අදහස් වේ:

"සේවා නියුක්තයන්ගේ භාර අර ..." යන්නෙන් 1980 අංක 40 දරන සේවා නියුක්ත භාර අරමුදල් පනත මගින් පිහිටුවන ලද සේවා ... න්ගේ භාර අරමුදල අදහස් වේ:

"නිවාස මූල්‍ය සංස්ථාව" යන්නෙන්, නිව ... නීමේ කාර්යය සඳහා ණය ප්‍රදානය කිරීමට බලය ප ... ඇති, නීතිය මගින් හෝ ඒ යටතේ පිහිටුවන ලද යම සංස්ථාවක් අදහස් වේ:

"ජාතික නිවාස සංවර්ධන අධිකාරිය" යන්නෙන්, 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනතින් පිහිටුවන ලද, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අදහස් වේ:

"ජාතික ඉතිරි කිරීමේ බැංකුව" යන්නෙන්, 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනතින් පිහිටුවන ලද ජාතික ඉතිරි කිරීමේ බැංකුව අදහස් වේ:

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන හා ඉටු කරනු ලබන බලතලවලට, කාර්යවලට හා කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ පිහිටුවන ලද යම් අධිකාරියක් ද ඊට ඇතුළත් වේ:

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය යටතේ පිහිටුවනු ලැබූ පළාත් සභාවක් අදහස් වේ:

"සෙවණ අරමුදල" යන්නෙන්, 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනතේ 5 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ අරමුදල අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.